# අපරාධ නිවාරණයෙහි ලා දඬුවම් ක්‍රමවේදයෙහි උපයෝගීතාව පිළිබඳ බෞද්ධ විමර්ශනයක්

එන්. එස්. ලසන්ත[1]

මිනිසාගේ ආරම්භය කෙදින කෙසේ සිදු වූවාදැයි නිශ්චය වශයෙන් නිගමනය කළ නො හැකි වන්නා සේ ම අපරාධයන්හි ආරම්භයත් කෙදින කෙසේ සිදු වූවාදැයි නිශ්චය කිරීම අපහසු කටයුත්තක් වනු ඇත. ඒසේ වුවද මුල් බුදුසමයාගත සූත්‍ර දේශනාවන්හි අන්තර්ගතය පරීක්ෂා කිරීමේ දී සමාජයෙහි අපරාධ පහළ වූ පිළිවෙළ හේතු-ඵල සම්බන්ධානුකූලව හඳුනා ගත හැකි ය. සමාජයෙහි ආරම්භය පිළිබඳ අදහස් ඉදිරිපත් කෙරෙන අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ප්‍රථම අපරාධය වශයෙන් සමාජගත වනුයේ සොරකම වෙයි. අනතුරුව මුසාවාදය, ප්‍රාණඝාතය, කේළාම් කීම, කාමය වරදවා හැසිරීම ආදී කොටැති සාවද්‍ය ක්‍රියාවන් ප්‍රභවය වූ බව දැක්වෙයි. දීඝ නිකායෙහි අන්තර්ගත චක්කවත්ති සීහනාද සූත්‍රාන්තර්ගත තොරතුරු පරීක්ෂා කිරීමේ දී පෙනී යනුයේ ද සොරකම පළමුවෙන් ම සමාජ අක්‍රමිකතාවක් වශයෙන් බිහි වූ බව යි.

''අපරාධ'' යන පදය නිර්වචනය කිරීම හුදෙක් පහසු වූ කාර්යයක් නො වන අතර ශ්‍රී ලාංකේය දණ්ඩ නීති සංග්‍රහයේ දී පවා ''මහජනයා, රජතුමා, විනිශ්චයකරු, ආණ්ඩුව, අග්‍රාණ්ඩුකාරතුමා'' ආදී පද හඳුන්වා දී තිබුණ ද අපරාධ පිළිබඳව අර්ථ නිරූපණයක් ඉදිරිපත් කර නැත. පුද්ගල ඓක්‍යයෙන් නිර්මිත සමාජයෙහි ස්ථාවරභාවය බණ්ඩනය කරන ඕනෑ ම ක්‍රියාවක් අපරාධයක් වශයෙන් හඳුන්වා දිය හැකි ය. එමෙන් ම එය සමාජ සම්මත නීතිය උල්ලංඝනය කරන්නක් විය යුතු ය.

මෙවන් ස්වරූපයක් ගනු ලබන අපරාධ, සමාජ ව්‍යසනයක් බව ඉතා පැහැදිලි කරුණක් බැවින් රාජ්‍ය බලය උසුලන සෑම ආණ්ඩුවක් මඟින් ම සිදු කළ යුතු වැදගත් කාර්යයක් වනුයේ අපරාධ නිවාරණය වෙයි. නූතන ලෝකයෙහි අපරාධ නිවාරණයෙහි ලා උපයුක්ත සාර්ථක ම ක්‍රමවේදය වශයෙන් පිළිගැනීමට ලක් වී ඇත්තේ දණ්ඩන නියමයන් ක්‍රියාත්මක කිරීම ය. එසේ වුවද දණ්ඩනයන් මාර්ගයෙන් අපරාධ නිවාරණය වනු ඇත්දැයි නූතනයේ පැන නැඟී ඇති ප්‍රධාන ගැටලුවක් වී හමාර ය. එහෙයින් දණ්ඩනය යනු කුමක්දැයි හඳුනාගැනීම ද වැදගත් වෙයි. යම් පුද්ගලයෙක් වරදක් කළ විට හෝ වරදක් කළේ යැයි සලකනු ලැබූ විට ඔහු විසින් අගය කරනු ලබන වටිනා වස්තු, පුද්ගල ආදී දේ තුළින් ඔහු ඈත් කොට තැබීම සහ ඒවා ඔහුට ලබා නො දීමට කටයුතු කිරීම දඬුමවක් වශයෙන් සැළකිය

1 සහකාර කථිකාචාර්ය, බෞද්ධ අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය.
susillasantha@gmail.com

හැකි බව O. Turk විසින් අදහස් කරනු ලැබ ඇත. මූලික වශයෙන් දණ්ඩනය යනුවෙන් අදහස් කරනුයේ අපරාධයක් සිදු කළ තැනැත්තාහට රටක නීතිය මඟින් ලබා දෙන්නක් වුව ද පොදු සමාජය මඟින් ද විවිධ දඬුවම් ලබා දිය හැකි ය. අප රටේ දණ්ඩ නීති සංග්‍රහයෙහි 52 වන වගන්තියෙහි සඳහන් වන අයුරින් අපරාධ සඳහා වන දණ්ඩන ක්‍රමවේදයන් 05ක් දැකිය හැකි ය.

- මරණය
- බන්ධනාගාරගත කිරීම
    - බරපතළ වැඩ ඇතිව,
    - ලිහිල්ව,
- කස පහර දීම
- දේපළ අහිමි කිරීම
- දඩ ගැසීම

මෙවැනි දණ්ඩන ක්‍රමයක් ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ සෑම රටක ම ක්‍රියාත්මක වනු දැකිය හැකි ය. ඒවායේ ක්‍රියාකාරීත්වයට අනුලෝමව ලෝකයෙහි අපරාධයන්ගේ අඩු වීමක් දැකිය හැකි නම් එම දණ්ඩන ක්‍රමවේදය සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන්නේ යැයි තීරණය කළ හැකි ය. ලෝකයෙහි තත්ත්වය මීට වෙනස් වන හෙයින් දඬුවම අපරාධ නිවාරණයෙහි ලා උපයුක්ත කර ගත හැකි සාර්ථක ක්‍රමවේදයක් වශයෙන් හැඳින්විය නො හැකි ය. නූතන ලෝකය දඬුවම් මාර්ගයෙන් අපේක්ෂිත ප්‍රතිඵල සතරක් වෙයි.

- විපාක විඳීමට සැලැස්වීම
- නිවාරණය
- අශක්නුකරණය
- පුනරුත්ථාපනය

පුද්ගලයා කළ වරදට විපාකයක් වශයෙන් දඬුවමක් ලබා දීම සිදු වෙයි. එමෙන් ම අපරාධ නිවාරණය ද එමඟින් අපේක්ෂිත ය. වරදකරු කෙටි කාලයක් තුළ නැවත සමාජගත වීමෙන් සිදුවිය හැකි ගැටලු පාලනය කිරීම අශක්නුකරණය නම් අරමුණ යි. පුනරුත්ථාපනයෙන් අපේක්ෂා කෙරෙනුයේ වරදකරු සිය වරද පිළිබඳ පශ්චත්තාප වීමෙන් නැවත එම වරද සිදු නො කරන පුද්ගලයෙකු බවට පත් කරලීම වෙයි. නූතනයේ භාවිත දණ්ඩන ක්‍රමයන්ගෙන් මෙම අරමුණු සඵල වේදැයි විමසිය යුතු ය. මනුෂ්‍ය ඝාතන සඳහා ලබා දිය යුතු දඬුවම වශයෙන් දණ්ඩ නීති සංග්‍රහය ඉදිරිපත් කරනුයේ මරණීය දණ්ඩනය යි. එසේ නැතහොත් බරපතළ වැඩ ඇතිව දිවි ඇති තෙක් බන්ධනාගාර ගතකිරීම සිදු වෙයි. මරණීය දණ්ඩනය පුද්ගලයාට ලබා දීම තුළින් ඔහු කළ වරද පිළිබඳ පශ්චාත්තාප වීමට අවස්ථාවක් වරදකරුට නො ලැබී යයි. එයින් මිදී සමාජගත වීමට ඇති අයිතිය ඔහුට අහිමි

කිරීමක් එමඟින් සිදු වෙයි. සංක්ෂිප්තව දක්වන්නේ නම් දඬුවමින් අපේක්ෂිත අරමුණු බොහෝමයක් මරණීය දණ්ඩනයෙන් ඉටු වීමක් දැකිය නො හැකි ය. මන්ද? වරදට දඬුවම ලැබීමත් සමඟ ඔහුගේ දිවිය ද අහිමි වන බැවිනි.

බන්ධනාගාර ගත කිරීම ද ඇතැම් විට සාර්ථක දඬුවම් ක්‍රමයක් නො වෙයි. සිර දඬුවම් ලබන පුද්ගලයා තමන් කළ වරද පිළිබඳ පසුතැවිලි වීමට වඩා ආණ්ඩුව, විනිශ්චයකරු, පැමිණිලි පාර්ශ්වයේ සාක්ෂිකරුවන් සමඟ වෛරී සිතුවිලි තම සිත තුළ වර්ධනය කර ගනියි. එමෙන් ම විශේෂ අවසරයන් හෝ දේශපාලන මැදිහත් වීම් මත හෝ නිදහස ලබන එවන් පුද්ගලයන්ගෙන් සමාජයට යළි අපරාධ සිදු වීමේ අවධානම වැඩි ය. දේපළ අහිමි කිරීම සහ දඬ ගැසීමාදී දණ්ඩන ක්‍රමවේදයන් පිළිබඳ සැළකීමේ දී ද යථෝක්ත අපේක්ෂාවන් සම්පූර්ණ වන බවක් නො පෙනේ.

අපරාධ පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් විමසා බැලීමේ දී දඬුවම අපරාධ නිවාරණයට සාර්ථක ම විසඳුම් මාර්ගය නො වන බව තහවුරු වෙයි. බුදු දහම වූ කලී සමාජ ක්‍රියාකාරකම් පටිච්චසමුප්පන්න ආකාරයෙන් විග්‍රහයට ලක් කරන යථාර්ථවාදී දර්ශනයකි. එසේ හෙයින් අපරාධ නිවාරණය සඳහා ද බුදු සමයෙන් ඉදිරිපත් වනුයේ හේතු-ඵළ සම්බන්ධතා ඉගැන්වීමකි. මෙම ඉගැන්වීම චක්කවත්තීසීහනාද සූත්‍රය, කූටදන්ත සූත්‍රය ප්‍රධාන කොට ඇති බෞද්ධ දේශපාලන දර්ශනය පිළිබඳ ඉගැන්වීම් අන්තර්ගත සූත්‍ර දේශනා ප්‍රමුඛ වෙයි. අග්ගඤ්ඤ සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට පුද්ගලයා අදත්තාදානය සඳහා යොමු වනුයේ ආර්ථික පරිහානිය හේතුවෙනි. චක්කවත්තීසීහනාද සූත්‍රයෙහි සඳහන් වන ආකාරයට රජු අපරාධ නිවාරණයට පියවර ගනුයේ සොරුන්ගේ දරිද්‍රතාව තුරන් කර දමමින් වුව ද අපරාධ වර්ධනය වනුයේ එම ක්‍රියාමාර්ගය අදූරදර්ශී වූ බැවිනි. සොරුන්ට ධනය දීම හේතුවෙන් සොරකම රාජ අනුග්‍රහය ලැබීමේ මාධ්‍යයක් වශයෙන් සැළකූ සෙසු වැසියා ද සොරකම වෙත යොමුවීම සිදු විය. දෙවෙනි වර සොරුන් මර්දනය සඳහා දැඩි දඬුවම් භාවිත කළ රජු ආභාසයට ගත් සෙසු වැස්සෝ ද සොරුන්ගෙන් සිය වත්කම් ආරක්‍ෂා කර ගැනුමට නීතිමය බලය හසුරුවන්නට වූහ. කූටදන්ත සූත්‍රයේදී නුවණැති පෙරෙවි බමුණාගේ අවවාද මත ක්‍රියා කරන රජු ඒ ඒ පුද්ගල කණ්ඩායම්හි අවශ්‍යතා අනුව කටයුතු කිරීම හේතුවෙන් සාර්ථකව අපරාධ නිවාරණය කළ බව පැහැදිලි ය. මෙමනිසා රටක අපරාධ මර්දනයෙහි ලා සැලසුම් සම්පාදනය සුදුසුකම් ලත් ව්‍යවස්ථාධායක මණ්ඩලයකට පැවරිය යුතු ය. රාජාණ්ඩු පාලන ක්‍රමයක දී වුවද රජු ඒ සඳහා අවශ්‍ය උපදේශ ඒ ඒ ක්‍ෂේත්‍රයන්හි විශාරදයන්ගෙන් විමසිය යුතු ය. මේ අනුව බෞද්ධ ඉගැන්වීම් අනුව අපරාධ නිවාරණය සඳහා රාජ්‍යයක ව්‍යවස්ථාධායක, විධායක, අධිකරණ යන අංශ තුනෙහි ම සහයෝගී ක්‍රියාකාරීත්වයක් අවශ්‍ය ය.

එහෙයින් අධිකරණයමය ක්‍රියාමාර්ගයක් වූ දඬුවම මඟින් පමණක් ම අපරාධ නිවාරණය අපේක්‍ෂා නො කළ යුතු ය. ඒ සඳහා දේශපාලනික, ආර්ථික,

සමාජ යනාදී සෑම අංශයකින් ම ව්‍යවස්ථාධායක සහ විධායක ආයතනයන්ගේ ද ක්‍රියාකාරීත්වය අවශ්‍ය වෙයි. එහි දී බෞද්ධ දේශපාලන ඉගැන්වීම් වූ දස සක්විති වත්, දස රාජධර්ම, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, ආදී ඉගැන්වීම් උපයෝගී කරගත යුතු ය. පාලිත පක්ෂයෙන් ද අපරාධ නිවාරණය සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු ය. එහි දී ප්‍රධාන වශයෙන් සෑම පුවැසියෙකු ම පංචශීල ප්‍රතිපදාවෙන් යුක්ත විය යුතු ය. කායික සහ වාචසික සංවරයෙන් යුක්ත වීමේ දී මානසික සංවරයක් ඇති වෙයි. තිදොර සංවර වූ පුද්ගලයා තුළ මානසික සංහිඳියාව ඇති වී සමාජය කෙරෙහි සතර බඹ විහරණයෙන් යුතුව වාසයට පෙළඹෙයි. ඉවසීම ප්‍රගුණ කිරීමට යොමු වෙයි. අන්‍යෝන්‍ය ගරුත්වය වෙතින් ඇති වන අන්‍යෝන්‍ය සුහදත්වය, විශ්වීය මෛත්‍රිය මඟින් අපරාධ මර්දනය වෙයි.
මේ අනුව අපරාධ මර්දනය සඳහා එක ම සහ සාර්ථක ම ක්‍රියා පිළිවෙත වනුයේ දඬුවම නො වන බවත්, අපරාධයට බලපෑ හේතූන් සඳහා නිවැරදි විසඳුම් නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම අපරාධ නිවාරණය සඳහා ඇති උචිත ම ක්‍රමවේදය බව බෞද්ධ දර්ශනාගත තොරතුරු අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි.

**ප්‍රමුඛ පද:** අපරාධ, දඬුවම, නිවාරණය, මරණීය දණ්ඩනය, අධිකරණය, නීතිය. වරදකරු

**ආශ්‍රිත ග්‍රන්ථ**

*දීඝ නිකාය* 01, (1962). බුද්ධ ජයන්ති මුද්‍රණ. නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝ නිකාය* 02, (1976). බුද්ධ ජයන්ති මුද්‍රණ. නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දණ්ඩ නීති සංග්‍රහය* - 15 වෙනි අධිකාරය, (1970).

පීරිස් ජී. එල්. (1998). *ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය.* කොළඹ: එස් ගොඩගේ සහ දහෝදරයෝ.

රත්නපාල, නන්දසේන. (1991). *අපරාධ විද්‍යාවේ මූලධර්ම.* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.